## විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

**සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව**




**“කොළඹ ගියාට පස්සෙ ස්නේහා පණ්ඩිත වෙලා... ඉස්සර ඔහොම නැහැ.. ඉස්සර ස්නේහා ලෝකෙ රටේ වෙන දේ තියා අල්ලපු වැටේ වෙන දේවත් දැනගෙන හිටියෙ නැහැ”**

## ස්නේහාගේත් අකලංකගේත් කතාව



සිය නිවසටම පෙට්ටි දෙකක භාණ්ඩ එවීම කිසිවකු විසින් කරන ලද සරදමක් ලෙස ස්නේහාට දැනුණි. මෙවන් දෙයක් කරන්නට සිතන තමන් දන්නා හඳුණන කිසිවකු මතකයට නගා ගන්නට ඇයට නොහැකි විය. තාත්තා කිව් ලෙස සමහරවිට මෙය රෝහලෙන්ම එවන්නට ඇතැයි අවසන ඇය සිතුවා ය. එසේ නම් මේ පිළිබඳව ඔවුන්ට ස්තුති කළ යුතු ය. ඇය සිරිවර්ධන මහතාට දුරකතන ඇමතුමක් ගත්තේ එනිසා ය. එහෙත් තෑගි පෙට්ටි දෙකේ කතාව ඇසූ ඔහුද විමතියට පත්විය.

“අනේ මන්දා ස්නේහා.. එහෙම දෙයක් කරන්න අපට ඉඩක් ලැබුණානම් ඒක හොඳයි කියල දැන් මටත් හිතෙනවා.. ඒත් මේ පෙට්ටි නම් එව්වෙ අපි නෙවෙයි..” ඔහු කීවේ ය. ස්නේහාට තුන් මසක පඩි ගෙවා ඇති බැවින් ඇයට අගහිඟයක් තිබීමට හැකියාවක් නොමැති බව ඔහු දනියි. එනිසා ඇයට සහයක් වන්නට මෙවන් තෑගි යැවීමේ අවශ්‍යතාවක් ඔහුට දැනී තිබුණේ නැත. අනික් අතින් තවත් මසක් යනවිට ඇය නැවත සේවයට කැඳවන්නට ඔහු හෙමින් සීරුවේ කටයුතු යොදමින් සිටියේ ය.

“අනේ මන්දා සර්.. කවුද එහෙනම් මේව එවන්න ඇත්තෙ? මට හිතාගන්නවත් බැහැ..” ස්නේහා කීවා ය.

“ස්නේහගෙ කවුරු හරි යාලුවෙක් එවන්න ඇති.. දවසක් දෙකක් යනකොට දැනගන්න ලැබෙයිනෙ..” සිරිවර්ධන මහතා කීවේ යමක් කියන්නට අවශ්‍ය නිසා ය.

ඒ කියූ දවස දෙක ගතවුණේ ස්නේහාට කිසිදු හෝඩුවාවවක් ලබා නොදෙමින් ය. ඒ ගැන සිතමින් කල් මරන්නට ස්නේහා නොසිතුවා ය. ඇය වඩා ක්‍රියාශීලීව තරුණ සමිතියේ කටයුතු වලට සහභාගි වූවා ය. ඒ වැඩ ඇගේ සිතට සහනයක් පමණක් නොව සතුටක්ද ලබා දුන්නේ ය. ඉසුර පන්සලේ පටන්ගත් හවස පන්තියේ උගන්වන්නටද ඈ වරින් වර ගියා ය. හව්හරණක් නැති පොඩි දරුවන්ට යමක් කියා දීමෙන් ඈ අපමණ සතුටක් ලැබුවා ය. ඒ සතුට තවත් වැඩි වූයේ ලොකු හාමුදුරුවන් පවා වරින් වර ඇය පැසසූ නිසා ය.

“මේ දරුව කොළඹ නොයා ගමේම හිටිය නම් හොඳයි කියල දැන් තමයි හිතෙන්නෙ” උන්වහන්සේ වරක් කීහ. “..ඒත් ඉතින් සමාජ සේවයටම ජීවිතේ කැප කරලා හරියන්නෙ නැහැනෙ.” දෙවෙනි වාක්‍යය උන්වහන්සේ කීවේ ඉසුර දෙස බලමින් ය. “...මං මේ කිව්වේ ඉසුර මහත්තයටම තමයි”

ඉසුර සුපුරුදු පරිදි කිසිවක් නොකියා සිනාසුණේ ය.

“ඉසුරයිය මේ පාර පළාත් සභාවෙ ඡන්දෙට ඉල්ලන්නලු යන්නෙ” ස්නේහා කීවේ කටට ආ නිසා මිස ඉසුර කී දෙයක් නොවේ.

“ඒකත් නරක නං නැහැ.. කොහොමත් ඉසුර මහත්තයට හරි යන්නෙ ඒ වගේ දෙයක් තමයි.. ඉල්ලමු බලන්න.. අපටත් උදව් කරන්න ඇහැකිනෙ..” හාමුදුරුවන්ගේ උනන්දුව සඟවාගත නොහැකිය. ඉසුර ඒ මග යන්නේ නම් එය ගමටද සෙතක් වන බව උන්වහන්සේට සිතෙයි. “දැන් ඉන්න දේශපාලකයෝ ඔක්කොම හොරු මහත්තයා.. අපට දැන් ඕනෙ තමන්ගෙ බඩ වඩාගන්න දේශපාලනය නොකරන අවංක පිරිසක් කවුන්සලේට යවන්න.. රට හදන්න නං මේ හොරු ඔක්කොම අල්ලලා මූදට දාලා අලුත් අවංක තරුණ පිරිසක් ඉස්සරහට ගන්නම ඕනෙ.. අපි හැමදාම කරන්නෙ එක හොරු රැළක් පන්නලා තවත් හොරු රැළකට බලේ දෙන එකනෙ.. දැන් තියෙන්නෙ ඒ හොරුත් එපා මේ හොරුත් එපා කියලා අවංක පිරිසක් ඉස්සරහට ගන්න එක”

“ඉස්සෙල්ලම වෙනස් කරන්න ඕනෙ මේ හොරුන්ට බලය දෙන අපේ මිනිස්සුන්වයි අපේ හාමුදුරුවනෙ.. බලන්න.. අපි හොරු පැත්තක තියමුකො.. මිනීමරුවන්ට පවා ඡන්දෙ දෙන පිස්සු සමාජයක්නෙ අපට

34 වන පිටුවට